**ශීර්ෂය 405- විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇතිකිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇතිකිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇතිකිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 21 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 28 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 විගණන සාක්ෂි නොවීම

---

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

රාජ්‍ය ආයතන 3 ක් සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු.1,395,222,000 ක් හා මූලධන වියදම රු.310,280,000 ක් වශයෙන් එකතුව රු.1,705,502,000 ක් වැය කර තිබුණි. රාජ්‍ය අමාත්‍යාංශය විසින් රාජ්‍ය ආයතන තුනේ මෙම වියදම්වලට අදාල තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පහත දැක්වෙන වියදම්, අදාල කාර්යයන්වලටම වැය කළේ ද යන්න පරීක්ෂා කළ නොහැකි විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාරා ආයතනයේ වෙනත් මෙහෙයුම් වියදම් වැය විෂයය යටතේ X-Press Pearl නෞකාව ගිනි ගැනීම සම්බන්ධයෙන් සිදු වූ බලපෑම තක්සේරු කිරීමට අදාල පර්යේෂණ කටයුතු සඳහා රු.50,000,000 ක අතිරේක ප්‍රතිපාදන ලබා දී තිබීම හේතුවෙන් සංශෝධිත ඇස්තමේන්තුව රු.93,600,000 ක් විය. වර්ෂය අවසානයේ රු.77,155,000 ක් වියදම් කර තිබුණ ද එම පර්යේෂණ කටයුතුවල සාර්ථකත්වය පිළිබඳ විස්තර රාජ්‍ය අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | X-Press Pearl නෞකාව ගිනිගැනීමට අදාළව බලපෑම් තක්සේරුවට අදාළ පර්යේෂණ කටයුතු පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කර ඇති බව. | වැයකර තිබුණු වියදමට අදාලව පර්යේෂණ කටයුතුවල සාර්ථකත්වය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | නාරා ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා වැයකර තිබුණු රු.110,000,000 ක් සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ පර්යේෂණ හා සංවර්ධන කටයුතු මොනවාද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | නාරා ආයතනයේ සිදු කරනු ලැබූ පර්යේෂණ හා සංවර්ධන කටයුතු දැක්වෙන වාර්තාවක් ඉදිරිපත් කර ඇති බව. | වැයකර තිබුණු වියදමට අදාලව සිදුකරනු ලැබූ පර්යේෂණ හා සංවර්ධන කටයුතු මොනවාද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යයන් ඉටුකරගැනීම සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) වෙත පවරන ලද සංවර්ධන ව්‍යාපෘති 05 වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වැය කර තිබුණු රු.1,283,256,961 ක් සම්බන්ධයෙන් වූ ගොනු විගණනයට ඉදිරිපත් නොවූ අතර එම ආයතනය විසින් එවන මාසික වියදම් සාරාංශ විස්තරවලින් පමණක් ලෙජර් ගිණුම් පවත්වා තිබුණි. | අවශ්‍ය විටක විගණනය සඳහා අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට හෝ අධිකාරියට පැමිණ හෝ අවශ්‍ය ලිපි පරීක්ෂා කිරීමට අවස්ථාව සැලසිය හැකි බව. | ව්‍යාපෘතිවලට වැයකළ අරමුදල් අදාල කාර්යයන්වලට යෙදවීම සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත් පසුවිපරම් කටයුතුත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය වෙත පියවිය යුතු අග්‍රිම ශේෂය රාජ්‍ය අමාත්‍යාංශයේ මුදල් පොත් අනුව රු.12,450,550 ක් වුවත් එම මුදල නොපියවා ඉන් රු.550 ක් පමණක් පියවා, ලංකා ධීවර සංස්ථාව වෙත රු.12,450,000 ක අත් මුදල් ලබාදීමට අංක 103 ගෙවීම් වවුචරය පිළියෙල කර තිබුණ ද ලංකා ධීවර සංස්ථාවට එම අත් මුදල ගෙවනවා වෙනුවට දින 28 කට පසුව එනම් 2022 ජනවාරි 28 දින භාණ්ඩාගාරයට ආපසු ලබාදීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද එම මුදල සමාලෝචිත වර්ෂයේ අංක 405-2-3-77-2506 දරන වැය විෂයය යටතේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ධීවර සංස්ථාව විසින් ඒ සඳහා මුලාශ්‍ර ලියවිලි ලබා නොදුන් බැවින් එම මුදල භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද බව. | වර්ෂ අවසාන ඉතිරි මුදල් ශේෂයෙන් චෙක්පත් නිකුත් නොකර භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වේ. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නාරා ආයතනය වෙත 405-2-4-2-2507අංක දරන පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා වෙන්කර දෙන ලද රු.250,000,000 ක මුදලින්, මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් යටතේ රු.60,000,000 ක් මාරුකිරීම නිසා සංශෝධිත ඇස්තමේන්තුව රු.190,000,000 ක් විය. එම ප්‍රමාණයෙන් ද සියයට 42 කට සමාන රු.80,000,000 ක් උපයෝජනය කර නොතිබුණි. | පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ක්ෂේත්‍ර කටයුතු වල නිරත වීමේ අපහසුතාවය හේතු කොටගෙන අදාළ ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගැනීම අඩුවූ බවත් පැවති විදේශ විනිමය ගැටළු මත අදාළ රසායනික ද්‍රව්‍ය සැපයුම් අඩාලවීමද මේ සඳහා විශාල බලපෑමක් ඇති කරන ලද බව. | පර්යේෂණ කටයුතු සඳහා ප්‍රතිපාදනය කළ අරමුදල් ඒ සඳහා යෙදවීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) මුදල් රෙගුලාසි මාරුකිරීම් යටතේ එකතුව රු.120,000,000 ක් මාරු කර නාරා ආයතනයේ ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සඳහා රු.30,000,000 ක්ද ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම සඳහා රු.105,000,000 ක්ද විද්‍යාගාර නවීකරණය සඳහා රු.60,000,000 ක්ද වශයෙන් එකතුව රු.195,000,000 ක් වෙන්කර තිබුණි. එයින් රු.65,500,000 ක් පමණක් වැයකර තිබුණු බැවින් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 66 කට සමාන රු.129,500,000 ක් ඉතිරි වී තිබීම අනුව, මුදල් රෙගුලාසි යටතේ මාරුකළ මුළු මුදලම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | රජය මගින් ප්‍රාග්ධන වියදම් සඳහා පනවන ලද සීමාවන් මෙන්ම 2022 වර්ෂයේදී අදාළ කාර්යය සඳහා වියදම් පියවාගැනිමේදී ඇතිවන ගැටළු නිසා ප්‍රදානය අනුමත නොකිරීමට රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා තීරණය කරන ලද බවත් හලාවත ධීවර වරායේ යටිතල පහසුකම් සංවර්ධනය (Green Harbour Development) – දෙවන අදියර, ව්‍යාපෘතිය රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත නවතා | ඇස්තමේන්තු තාත්විකව සිදු කළ යුතුය. |

| | |
|---|---|
| තවද වැය කරන ලද රු.65,500,000 ක මුදල සම්බන්ධ තොරතුරු රාජ්‍ය අමාත්‍යාංශය ලබාගෙන නොතිබුණු හෙයින් විගණනයේ දී පරීක්ෂා කිරීමට නොහැකි විය. | දමන ලද බව.<br><br>අමාත්‍යාංශය තුළ වාර්තාගත කිරීම් සිදු නොවන බවත් අදාළ ප්‍රගති සමාලෝචනවල දී හා ඉදිරිපත් වන ප්‍රගති වාර්තාවලද මේ සම්බන්ධ භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තාවන බව. |

## 2.3 සීමා ඉක්මවීම්

රජයේ අත්තිකාරම් කාර්යයන් සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් ඉක්මවීම් හා ළගා නොවීම් පිළිබඳ විගණන නිරීක්ෂණය පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 40501 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් කටයුතුවල උපරිම වියදම් සීමාව, අවම බැර සීමාව හා උපරිම හර ශේෂ සීමාව පිළිවෙලින් රු.2,500,000 ක් රු.300,000 ක් හා රු.3,200,000 ක් ලෙස සීමාවන් වෙනස් කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීමට කටයුතු කරන බව දැනුම් දී තිබුණ ද මෙම වාර්තාවේ දිනය වන විටත් එම සීමාවන් අනුමත කළ බවට තොරතුරු රාජ්‍ය අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තව ද විගණනයට ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනයේ ACA-5 ආකෘතියෙහි එම ප්‍රතිශෝධිත සීමාවන් දක්වනු වෙනුවට විසර්ජන පනතින් අනුමත සීමාවන් වූ පිළිවෙලින් රු.3,000,000 ක් රු.750,000 ක් හා රු.5,000,000 ක් දක්වා තිබිම නිසා අවම බැර සිමාවට ළඟා වි නොතිබුණි. | අනුමත කිරීම් පිළිබඳව භාණ්ඩාගාරය විසින් රාජ්‍ය අමාත්‍යාංශය වෙත දන්වා නැති බවත් භාණ්ඩාගාරය විසින් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බව වාචිකව දන්වා ඇති බවත් ප්‍රතිශෝධිත අනුමත සීමාවන් ප්‍රමාද දෝෂයකින් ගිණුමේ සටහන් වී නැති බවත් අවම බැර සිමාව වූ රු 300,000 සීමාවට ළඟා වී ඇති බව. | ප්‍රතිශෝධිත අනුමත සීමාවන් පිළිබඳ තොරතුරු රාජ්‍ය අමාත්‍යාංශය විසින් භාණ්ඩාගාරය වෙතින් ලබාගෙන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලාදයිත්වය පිළිබද කලින් කල සමාලෝචනය කර ඇති අතර 2021 වර්ෂය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ වෙනස්කම් සිදු කර නොමැති බව. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුව මගින් සුවිශේෂී ප්‍රමුඛතා කාර්යයන් 8 ක් හඳුන්වා දී තිබුණ ද 2021 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට හා ඒ අනුව පිළියෙල කළ ප්‍රගති වාර්තාවට අනුව වැව්, කලපු හා ගොඩ ඉඩම් ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සැකසීම සහ මහ පරිමාණ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව සිදුකිරීම සඳහා ධීවර වරාය සංවර්ධනය කිරීම හැර අනෙකුත් පහත සඳහන් කාර්යයන් කෙරෙහි අවධානය යොමුකර සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | | |

| | | |
|---|---|---|
| (අ) අපනයන වෙළඳපොළ ඉලක්ක කරගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ඇති කිරීම සඳහා අවශය පහසුකම් සැපයීම. | මේ යටතේ ප්‍රධාන වැඩසටහන් තුනක් ක්‍රියාත්මක වූ බව. | ක්‍රියාකාරි සැලැස්මට හා ඒ අනුව පිළියෙල කළ ප්‍රගති වාර්තාවට අනුව ප්‍රගතිය ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) බහුදින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම. | මේ යටතේ ප්‍රධාන ක්‍රියාකාරකම් දෙකක් සැළසුම් කර ක්‍රියාත්මක කරමින් පවතින බව. | -එම- |
| (ඇ) නවීන සන්නිවේදන පහසුකම්, ශීතකරණ, ඉන්ධන සැපයුම සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව සහිතව සියලුම ධීවර වරායන්, නැංගුරම් ස්ථාන වැඩි දියුණු කිරීම. | මේ යටතේ වැඩසටහන් තුනක් සැලසුම් කර ක්‍රියාත්මක වෙමින් පවතින බව. | -එම- |
| (ඈ) මුහුදු හා මිරිදිය මත්ස්‍යයන් පුළුල් ලෙස බෝකිරීම සඳහා ධීවර ප්‍රජා සංගම් හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව වැඩසටහන් ආරම්භ කිරීම. | 2021 වසරෙහි මිලියන 111.59ක් වූ සමස්ථ මත්ස්‍ය ඇඟිල්ලන් නිශ්පාදනයෙන් මිලියන 17.45 (15.63%)ක් ප්‍රජා මූලික මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක මඟින්ද, ජලාශ වල ධීවර සමිති මඟින් කූඩු හා කොටු වල මිලියන 25.24 (22.61%) ක්ද නිෂ්පාදනය කර ඇති බව. | -එම- |
| (ඉ) පරිසර හිතකාමී නවීන අධි තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම. | ඉහළ මත්ස්‍ය බිම් පුරෝකථනය කිරීම මඟින් මසුන් ඇල්ලීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණික සහාය පතමින් ලෝක ආහාර සංවිධානය වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ඇති බව. | -එම- |
| (ඊ) ධීවරයින් සහ එම කර්මාන්තයේ නියැලෙන්නන්ගේ වෘත්තීමය පුහුණුව හා දැනුම දියුණු කිරීම. | පුහුණු වැඩසටහන් ධීවර දෙපාර්තමේන්තුව, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් සිදු කරනු ලබන බව. | -එම- |

**3.2** **කාර්යභාරයන් ඉටු නොකිරීම**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සිවිල් ඉංජිනේරු වැඩ හා යාන්ත්‍රික ඉංජිනේරු වැඩ සඳහා වෙන්කර තිබුණු රු.250,000,000 ක ප්‍රාග්ධන අරමුදල්වලින් රු.194,613,000 ක් වැයකර තිබුණ ද ප්‍රගති වාර්තාවට වියදම රු.287,260,000 ක් විය. තව ද යාන්ත්‍රික ඉංජිනේරු වැඩ යටතේ සයුරු නැව අලුත්වැඩියාව සඳහා රු.23,000,000 ක සැලසුම් කර තිබුණු වැඩ සඳහා වියදම රු.14,640,000 ක් ටෙන්ඩර් කිරීම සඳහා පමණක් වූ බැවින් එම අලුත්වැඩියාව සම්බන්ධයෙන් භෞතික ප්‍රගතියක් ලබා නොතිබුණි. | 2021 වර්ෂය සඳහා අනුමත ප්‍රාග්ධන ප්‍රතිපාදන මුදල රු. 250,000,000 ක් වුවත් එම වර්ෂය තුළ ආයතනයට ලැබුණු මුළු මුදල වන රු. 194,613,000.00 ක මුදල වියදම් කර ඇති බව. | ක්‍රියාකාරි සැලැස්මට හා ඒ අනුව පිළියෙල කළ ප්‍රගති වාර්තාවට අනුව ප්‍රගතිය ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂය සඳහා සුදුවැල්ල ධීවර වරාය සංවර්ධනයට මූලික වියදම් ඇස්තමේන්තුව මඟින් රු. 150,000,000 ක් වෙන්කර මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් කළ පසු ඉතිරිය රු.73,000,000 ක් වුවද මුළු මුදලම උපයෝජනය කර නොතිබුණු අතර එම කාර්යය කිරීම අවලංගු කර තිබුණි. | සුදුවැල්ල ධීවර වරායට ආසන්නයේ විශාල ධීවර වරායක් වන ගන්දර ඉදිකිරීම ආරම්භ කළ හෙයින් ධීවර වරායක් ඉදිකිරීමේ කඩිනම් අවශ්‍යතාවයක් නොපවතින හෙයින් ඉදිරිකටයුතු සිදුනොකිරීමට තීරණය කරන ලද බව සහ ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය මෙන්ම ධීවරයන්ද මෙම තීරණයට එකඟ වූ අතර සුදුවැල්ල ධීවරයන්ගෙන්ද මේ තීරණය සඳහා විරෝධයක් පල නොවුණු බව. | ධීවර වරායන් ඉදිකිරීමට පෙර නිවැරදිව ශක්‍යතා අධ්‍යයනයන් සිදු කර සැලසුම් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | දොඩන්දූව ධීවර වරාය සංවර්ධනයට රු.100,000,000 ක ප්‍රතිපාදන මුදලින් ඉලක්ක කළ රු.25,000,000 ක කාර්යයන් සඳහා පමණක් රු.7,625,468ක වියදමක් දරා තිබුණු බැවින් අදාල කාර්යයේ භෞතික ප්‍රගතිය අඩු මට්ටමක විය. | අමාත්‍යාංශය මගින් සැලසුම් කළ පරිදී, ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම 2021 වර්ෂයේ අවසන් කාර්තුවේ සිදු කිරීමට තිබුනත් එම සැලසුම් පරිදී කටයුතු සිදු කරගෙන යාමට නොහැකි වූ බව. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | හම්බන්තොට ධීවර වරාය සංවර්ධනයට 2021 වර්ෂය සඳහා රු.20,000,000ක ප්‍රතිපාදන සලසා තිබුණ ද රු. 9,000,000 කට අදාල කාර්යයක් පමණක් සැලසුම්කර රු.1,054,749 ක් වැයකර තිබුණි. | 2021 වර්ෂය තුළ මීට අදාළ ප්‍රතිපාදන වියදම් කිරීමට නොහැකි වූ බව. | -එම- |
| (ඉ) | ගොඩබෑමේ ස්ථාන හා නැංගුරම්පළවල් 8 ක් සංවර්ධනයට රු. 18,000,000 ක් වෙන්කර තිබුණ ද මූලික වියදම් සඳහා රු. 1,900,000 ක් පමණක් වැය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 11 ක් පමණක් විය. | පැවති කොවිඩ් තත්ත්වය මත පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීමේ පැවති අපහසුතාවයක් හේතු කොට ගෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වූ බවත් තොටුපළ කිහිපයක් ආශ්‍රිතව භූ විද්‍යාත්මක සමීක්ෂණ සිදුකිරීම සඳහා අදාළ මුදල වැය වී ඇති බව. | -එම- |

**3.3 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා ධීවර සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීම වෙනුවෙන් වූ කාර්යය ඉටුකිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රමාණවත් කාලයක් ඇතිව පරිපූරක ප්‍රතිපාදනයක් ඉල්ලා නොතිබුණු හෙයින් 2021 දෙසැම්බර් 22 දින රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලැබී තිබුණු රු.40,350,000 ක පරිපූරක ප්‍රතිපාදනය සඳහා තවත් දින 07ක ප්‍රමාදයකින් එනම් 2021 දෙසැම්බර් 29 දින භාණ්ඩාගාරයෙන් අග්‍රිම ඉල්ලා තිබුණි. 2021 දෙසැම්බර් 31 දින රු.40,000,000ක අග්‍රිමය ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රමාණවත් කාලයක් නොමැතිවීම හේතුවෙන් පරිපූරක ප්‍රතිපාදනයම ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එම අග්‍රිමයෙන් රු.27,550,000ක් රාජ්‍ය අමාත්‍යාංශය විසින් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) වෙත සංවර්ධන වැය විෂයයන්ට වැය කිරීම සඳහා ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. මේ අනුව එම මුදලින් අරමුණු වූ කාර්යයන් ඉටු වී තිබේ ද යන්න තහවුරු නොවීය. | මෙම ප්‍රතිපාදන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලැබුණේ 2021.12.27 දින වන අතර ගිණුම් අංශය වෙත ලැබුණේ 2021.12.28 දින බව, වවුචර් ලැබී ඇති ප්‍රමාණය අනුව මුදල් උපරිම ඵලදායි ලෙස භාවිතා කිරීමට එම අරමුදල් ප්‍රයෝජනයට ගන්නා ලද බව සහ පරිපූරක ප්‍රතිපාදනය ප්‍රයෝජනයට ගත නොහැකි වූයේ ධීවර සංස්ථාව සතුව මූලාශ්‍ර ලියවිලි නොතිබීම නිසා බව. | ප්‍රමාණවත් කාලයක් ඇතිව පරිපූරක ප්‍රතිපාදනයන් ඉල්ලුම් කිරීමත්, ව්‍යාපෘතිවලට වැයකළ අරමුදල් අදාල කාර්යයන්වලට යෙදවීම සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත් පසුවිපරම් කටයුතුත් කළ යුතු වේ. |